වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - 2023
---------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වියදම් රු.222,600ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී ප්‍රාග්ධනිත කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු හෙක්ටයාර 0.9371ක ඉඩම් 04ක් සහ රු.625,000ක් වූ කැබ් රථයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | රු.25,433,296ක් වටිනා මෝටර් රථ, යන්ත්‍ර හා උපකරණ ගිණුම යටතේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලය තුළ අවස්ථා 14ක දී ලබා දී තිබුණු රු.828,505ක අත්තිකාරම් පියවා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් පිළිබඳ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 571 (2) අනුව, 1996 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ රු.1,220,885ක කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | සෑම වර්ෂයකම අවසානයේ තැන්පතු නියාදනය කිරීම සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,630,333ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.5,281,783ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 11,793,304 | 12,465,214 | 12,109,948 | 5,542,701 | 9,383,172 | 8,011,088 | 8,278,319 | 5,262,269 |
| කුලී | 9,150,546 | 10,091,636 | 10,279,253 | 91,797 | 4,845,216 | 4,564,728 | 4,508,644 | 158,963 |
| බලපත්‍ර ගාස්තු | 1,400,500 | 1,540,350 | 1,660,350 | - | 1,598,250 | 1,218,125 | 1,218,125 | - |
| වෙනත් ආදායම් | 3,496,500 | 2,347,569 | 2,407,108 | - | 4,591,300 | 1,350,834 | 1,350,834 | - |
| | 25,840,850 | 26,444,769 | 26,456,659 | 5,634,498 | 20,417,938 | 15,144,775 | 15,355,922 | 5,421,232 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට රු.1,868,095ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා පැරණි රු.1,467,796ක ශේෂයක් පවතී. | මෙම මුදල් අය කිරීම සඳහා ජංගම වැඩසටහන් මෙන්ම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද සැලසුම් කර ඇත. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) දැන්වීම් පුවරු 48කින් 2023 වර්ෂය වෙනුවෙන් රු.198,600ක් අයවිය යුතුව පැවැතිණි. | අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරමි. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.4,413,445ක පිරිවැයක් දරා 2022 වර්ෂයේ වැඩ අවසන් කළ කසළ | ලැබෙන ප්‍රතිපාදන මත එම කටයුතු අවසන් කර කොම්පෝස්ට් | විධිමත්ව කසළ කළමනාකරණය |

| | | | |
|---|---|---|---|
| | අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු 2023 දෙසැම්බර් වන විටත් ආරම්භ කර නොතිබුණි. එම නිසා දෛනිකව රැස් කරන දිරන කසළ ටොන් 02ක් පමණ වලවල් කපා බැහැර කරමින් පැවතිණි. 2022 වර්ෂයේ ලද රු.950,000ක බෙලර් යන්ත්‍රය ද, විදුලි සැපයුම නොමැති වීමෙන් අභාවිතව පවතී. | නිෂ්පාදනය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. | කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෙළ බොජුන් හලේ සේවකයින්ට රු.336,000ක සාමාන්‍ය මාසික වැටුපක් ගෙවා තිබුණ ද, එහි මාසික සාමාන්‍ය ආදායම රු.370,000ක් පමණ විය. නිසි පරිදි ලියකියවිලි නඩත්තු නොකිරීම නිසා ලද ආදායමේ නිවැරදිතාව ද ගැටළුසහගත විය. | මේ වන විට ආදායම් අයවීම පැහැදිලිව ගොනුගත කර ලේඛන පවත්වාගෙන යයි. | නිසි පරිදි ලියකියවිලි නඩත්තු කළ යුතු අතර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ජල පාරිභෝගිකයින් 2159 දෙනෙකුට සපයන ජලය බීමට නුසුදුසු බවට තහවුරු කර තිබුණි. යොදා තිබුණු ජල මීටර් 165ක් අක්‍රියව පැවතීම නිසා පාරිභෝගිකයින්ගෙන් ස්ථාවර ගාස්තුවක් අයකරමින් පැවැතිණි. එමෙන්ම, ජල පාරිභෝගිකයින් 2018 දෙනෙකුගෙන් 2024 අප්‍රේල් 30 දිනට හිඟ ජල ගාස්තු රු.1,433,323ක් අයකර නොතිබුණි. | ජලය පිරිපහදු කිරිමට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දන්වා ඇත. ජලය සමඟ රොන්මඩ මිශ්‍රව ඇති බැවින් නව මීටර් සවිකළ හොත් එම මීටර්ද ඉක්මනින් අක්‍රිය විය හැක. | ජලය පිරිසිදු කර බෙදා හැරීමට හා හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අක්‍රියව පැවැති අභ්‍යන්තර දුරකථන පද්ධතිය ඉවත් කිරීමට 2023 මැයි මාසයේ ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට 2024 පෙබරවාරි දක්වා කල්ගත වීම නිසා එම කාලය තුළ ගෙවූ රු.128,322ක ස්ථාවර ගාස්තු නිෂ්ඵල වියදමක් විය. | 2024 මාර්තු වන විට අභ්‍යන්තර දුරකථන පද්ධතිය විසංධි කර ඇත. | රජයේ මුදල් ඉතා පිරිමැසුම්දායී ලෙස වැය කළ යුතු වේ. |

**3.3** **වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයට පෙර සිට පැවැති වාහන 04ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | වාහන 03ක අයිතිය පවරා ගැනීමට ලිපි යොමු කර ඇත. | වාහනවල අයිතිය පවරාගත යුතු වේ. |
| (ආ) | අබලි වාහන 06ක් 2024 අප්‍රේල් මාසය වනතුරුත් අලුත්වැඩියා හෝ අපහරණය කර නොතිබුණි. ඉන් 2014 වර්ෂයේදී අලුත්වැඩියා කිරීමට භාර දී තිබුණු ට්‍රැක්ටරයක් මේ දක්වා අලුත්වැඩියා කර නොතිබුණි. | අපහරණය සඳහා කමිටුවක් පත්කිරීමට කටයුතු කෙරේ.. | අංක 05/2020 හා 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. |